# මංගල, රනිල් හා බටහිරයෝ

මංගල සමරවීර මහතා ශ්‍රී ල නි ප (ම) කණ්ඩායම ලෙස සංවිධානය වීම මෙරට දේශපාලනයට දැනෙන්නක් නො වෙයි. මේ සංවිධානය (හෝ දේශපාලන පක්‍ෂය) වැඩිකල් නොගොස් ම තම අවමංගල ගමන යනු ඇත. අද දේශපාලනයෙහි එවැනි කණ්ඩායමකට පැවැත්මක් නැත. එබැවින් සමරවීර මහතා තම සගයන් කිහිප දෙනකු ද සමගින් එ ජා පක්‍ෂයට එකතුවීමත්, ශ්‍රී ල නි ප (ම) සංවිධානය, එ ජා පක්‍ෂයෙහි දියවී යැමත් කාලය පිළිබඳ ප්‍රශ්න වෙයි. අමාත්‍ය මණ්ඩල සංශෝධනයේ දී කලින් දැරූ ඇමති පදවි ලැබුණි නම් සමරවීර මහතා තවමත් ශ්‍රී ල නි පක්‍ෂයේ සාමාජිකයෙකි. ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතා සමරවීර මහතාට එසේ බලාපොරොත්තු වූ ඇමති පදවි නොදුන්නේ ම දේශපාලන වශයෙන් ගත්කල සමරවීර මහතා පුද්ගලයකු ලෙස එතරම් වැදගත් නොවන බව දැනගෙන තිබීම විය හැකි ය.

එහෙත් අවලංගු කාසියක් බවට පත් වී ඇති සමරවීර මහතාට යමක් කළහැකි යැයි සිතන්නෝ ද වෙති. ඇතැම් විට ඒ යමක් කළ හැකි වීමට වඩා හැකි නම් ඔහු ද සහභාගි කරවාගෙන තමන්ට අවශ්‍ය දේ කරගැනීමට මාන බැලීමක් විය හැකි ය. එසේ කල්පනා කරන්නෝ ඉංගිරිසින් ප්‍රමුඛ කරගත් බටහිරයෝ ය. ඉතා පැහැදිලිව ම බටහිරයන්ට මේ ආණ්ඩුව වැට්ටවීමට අවශ්‍ය ය. ඒ අන්කිසිවක් නිසා නොව බටහිරයන්ට දෙමළ ජාතිවාදය දිනවීම අවශ්‍ය බැවින් ය. එසේ කරන්නේ ද ඔවුන් දෙමළ ජනයාට විශේෂ දයාවක්, කරුණාවක් දක්වන නිසා නොව බටහිරයන් සිංහලත්වයට දක්වන තදබල විරෝධය හේතුකොටගෙන ය. එයට ඓතිහාසික, සංස්කෘතික හා චින්තන ආධිපත්‍යයික ආදී වශයෙන් කරුණු පසුබිම් වෙයි.

බටහිරයන්ගේ මෙරට සෘජු නියෝජිතයා වූ රනිල් වික්‍රමසිංහ මහතා ක්‍රියා කරන්නේ බටහිර න්‍යාය පත්‍රයකට අනුකූලව ය. ඒ මහතා ප්‍රමුඛ එ ජා පක්‍ෂය බලයට පත්වුවහොත් දෙමළ ජාතිවාදයට සන්ධීය රාජ්‍යයක් නොව සහසන්ධීය රාජ්‍යයක් ලබාදීමට කටයුතු කිරීම වැළැක්විය නො හැකි ය. එවැනි අවස්ථාවක දී එයට විරුද්ධවන්නන් ලේ ගංගාවක ගිල්ලවනු ඇත්තේ 1817 හා 1848 මෙරට නිදහස් සටන්වල දී එංගලන්තය ක්‍රියාකළ “මානවහිතවාදී” ආකාරය සිහියට නංවමිනි. අද මානව අයිතිවාසිකම් ගැන කතාකරන බටහිරයන් හා ඔවුන්ගේ කුලීකරුවන් එදිනට නිහඬවනු ඇත. ලංඩනයේ හා ග්ලාස්ගෝ නගරවල ත්‍රස්තවාදී තර්ජන හමුවේ දැනටමත් එංගලන්ත ආණ්ඩුව (නැති බ්‍රිතානියක් හා එක්සත් රාජධානියක් ගැන කතාකිරීම ම විහිළුවකි. බ්‍රිතානිය හා එක්සත් රාජධානිය යනු යටත්විජිත සැඟවීමට යොදාගන්නා නම් වෙයි) ක්‍රියාකර ඇත්තේ හදිසි අවස්ථාවක දී ක්‍රියා කරන්නේ කෙසේ දැයි අන් රටවලට ද කියා දෙමිනි. සැක පිට අත් අඩංගුවට ගන්නවුන් දින විසිඅටක් යන තුරු ඇප නොදී රඳවාගැනීමට අද එංගලන්ත පොලීසියට හැකි ය.

ලංකාව මානව අයිතිවාසිකම් කඩන්නේ ය යන චෝදනාව අද ඉදිරිපත් කරන්නෝ කවරහු ද? එක් පැත්තකින් සම සභාපතිවරු ඇතුළු බටහිර රටවල නායකයෝ ය. අනෙක් පැත්තෙන් බටහිරයන්ගෙන් යැපෙන රාජ්‍ය නොවන සංවිධානවල දාසයෝ ය. තවත් පැත්තකින් එ ජා පක්‍ෂය ය. රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය කාලයෙහි රටින් රට ගොස් කළ එකම කාර්යය වූයේ මෙරට මානව අයිතිවාසිකම් කැඩෙන්නේ යැයි හඬනගා කීම ය. ඔහුගේ විරුද්ධ පක්‍ෂ නායකකම මෙරටට තුට්ටුවකටවත් නො වටියි. ඔහු සේවය කරන්නේ බටහිරට ය.  මේ සියළු දෙනා අතරට මංගල සමරවීර මහතා ද එකතුකෙරී ඇත්තේ බටහිරයන් ම විසින් බවට අටුවා ටීකා අනවශ්‍ය වෙයි. මංගල සමරවීර මහතාට තමන් විසින් ම දේශපාලනයෙහි දී ගොඩනගා ගත් පෞරුෂයක් නැත. එබැවින් ඔහු අවශ්‍ය වන්නේ ම වෙනත් අයකුගේ පෞරෂ වර්ධනය වෙනුවෙන් කඩේ ඇරීමට ය.

තොප්පිගල සම්පූර්ණයෙන් ම අත්කර ගැනීමට තව මාස දෙකක පමණක් කාලයක් යනු ඇතැයි ඒ පිලිබඳ දන්නෝ කියති. එබැවින් තව දිනකින් දෙකකින් තොප්පිගල අල්ලාගත හැකි යැයි ඇතැම් ජනමාධ්‍ය කරන ප්‍රකාශ අහිතකර ය. ඉන් සිදුවන්නේ සතියක දෙකක කාලයක් ගිය පසු සාමාන්‍ය ජනතාව තොප්පිගල අල්ලාගත නොහැකි ප්‍රදේශයක් බවට සිතන්නට පුරුදුවීම ය. එසේත් නැතහොත් ආණ්ඩුවේ ප්‍රකාශ ගැන සැක පහළ කිරීම ය. කෙසේ වෙතත් නැගෙනහිර පළාත මුළුමනින්ම නිදහස් කරගැනීමෙන් පසුව ආණ්ඩුව කරන්නේ කුමක් ද? පැහැදිලිව ම කළ යුත්තේ වන්නියෙන් කොටි පරාජය කිරීම ය. ඒ නොකළ හැක්කක් නො වෙයි. අනභිබවනීය යැයි බටහිරයන් හා මෙරට ඔවුන්ගේ

© Prof. Nalin De Silva

සේවකයන් වූ මාක්ස්වාදීන්, රාජ්‍ය නොවන සංවිධානවල දාසයන් හා වෙනත් අය විසින් පෙන්වා දෙනු ලැබ තිබූ කොටි නැගෙනහිර පළාතේ දී කැණහිළුන් සේ පළායනු අපි දුටුවෙමු. වන්නියේ ද ඔවුන්ට උරුම වී ඇත්තේ ඒ ඉරණම ම මිස අනෙකක් නො වෙයි.

එසේ වුවත් කොටි ඒ ඉරණමෙන් මුදාගැනීමට එංගලන්තය ප්‍රමුඛ බටහිර රටවල් ඉදිරිපත් වී ඇත. එංගලන්තය වන්නියේ දී කොටි පරාදකිරීමට ඉඩ නො දෙනු ඇත. ඊනියා මානව අයිතිවාසිකම් කඩකිරීම් පිළිබඳ ව රනිල් වික්‍රමසිංහ මහතා හා තවත් අය කතාකරන්නේ එකම එක කරුණක් සඳහා ය. ඒ ආර්ථික සම්බාධක පැනවීමට හා එක්සත් ජාතීන්ගේ හමුදා ලංකාවට එවීමට තරම් තත්වයක් ලංකාවේ නිර්මාණය වී ඇති බව පෙන්වීමට ය. අද මංගල සමරවීර මහතාට  කළ හැකි එකම කාර්යය මේ මානව අයිතිවාසිකම් කැරොල් කරත්තය ඇදගෙන යෑම ය. ය. බටහිරයන් ඔහුට හා ශ්‍රීපති සූරියාරච්චි  මහතාට කැරොල් කරත්තය අදින්නට ඉඩ දී ඔවුන්ගෙන් උපරිම සේවය ලබාගැනීමට කටයුතු කරනු ඇත.

පසුගිය දා ලංකාවට ආධාර දෙන කණ්ඩායමේ සම සභාපතිවරුන් යැයි කියන්නෝ කරුණු හතරක් ගැන අවධාරණය කළහ. ඔවුන්ට අනුව ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට යුද විසඳුමක් නැත. දෙවනුව ආණ්ඩුව හා කොටි සංවිධානය මානව අයිතිවාසිකම් කඩකිරීමෙන් වැළකිය යුතු ය. තුන්වැනුව ආණ්ඩුව නෝර්වේ රාජ්‍යය ඊනියා පහසුකම් සපයන්නා ලෙස පිළිගන්නේ නම් නෝර්වේ නියෝජිතයාට කිලිනොච්චියට ගොස් කොටි හමුවීමට ඉඩදිය යුතු ය. අවසාන වශයෙන් ආණ්ඩුව ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට විශ්වාසනීය විසඳුමක් ඉදිරිපත් කළ යුතු ය. ශ්‍රී ල නි ප යෝජනා විශ්වාසනීය නොවන බව කීමට ද සම සභාපතිවරුන් අමතක කර නැත.

බටහිරයන්ට අවශ්‍ය කුමක් ද යන්න ඉතා පැහැදිලි ය. ඔවුන් බලාපොරොත්තු වන්නේ ආණ්ඩුව හමුදා මෙහෙයුම් නවතා කොටින්ට ඊනියා විශ්වාසනීය විසඳුමක් ඉදිරිපත්කර ඒ මත පදනම් ව සාකච්ඡා ඇරඹීම ය. එසේ නොකරන්නේ නම් ඊනියා මානව අයිතිවාසිකම් කඩකිරීම්වලට මුවා වී ආර්ථික සම්බාධක පණවා එක්සත් ජාතීන්ගේ හමුදා මෙරටට එවීමට ය. ආණ්ඩුව ඉතා පැහැදිලිව ම බටහිරයන්ට යටත් නොවිය යුතු ය. මෙරට ජනතාව ආණ්ඩු පත්කරගන්නේ ඔවුන්ට අවශ්‍ය පරිදි කටයුතු කිරීමට මිස බටහිරයන්ගේ අණසකට යටත්වීමට නො වෙයි. මෙය කීම පහසු වුවත් කිරීම එතරම් පහසු නැතැයි කිසිවකු සිතනු. එයට හේතුව රනිල් වික්‍රමසිංහ මහතා ඇතැම් ජනමාධ්‍ය ද හවුල්කර ගනිමින් කරන ප්‍රචාරය ය. ඒ ඔහුගේ ස්වාධීන ක්‍රියාවක් නොව බටහිරයන් ඔහුට නියම කර ඇති රාජකාරිය ඉටුකිරීමකි.

එහෙත් බටහිරයන් පරාජය කළහැකි ය. අද ආණ්ඩුව කළයුත්තේ කොටි සමග සාකච්ඡා ඇතිකිරීම සඳහා පදනම් යෝජනා ඉදිරිපත්කිරීම නො වෙයි. කොටි සමග කිසිම සාකච්ඡාවක් කළයුතු නො වෙයි. බටහිරයන් කොටි සමග සාකච්ඡා කළයුතු යැයි දිගින් දිගට ම බලකරන්නේ නම් ආණ්ඩුව ඔවුන්ට කිව යුත්තේ පළමුව ඔවුන් අල් ක්වයිඩා සංවිධානය සමග සාකච්ඡා කළයුතු බව ය. ආණ්ඩුව හමුදා මෙහෙයුම් මගින් කොටි පරාජය කිරීමට කටයුතු කරන අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා යෝජනා ඉදිරිපත්කළ යුතු ය. මෙරට විසඳීමට ඇති ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයක් නැත. මෙරට ජනවාර්ගික ප්‍රශ්නයක් වේ නම් ඒ ඉංගිරිසීන් යාපනයේ දෙමළ ප්‍රභූන්ට දුන් වරප්‍රසාද හේතුවෙන් ඇතිවූවක් වෙයි. ප්‍රශ්නයේ මුල ඇත්තේ ව්‍යවස්ථාදායකයෙහි දෙමළ ප්‍රභූන්ට සිංහල නායකයන් හා සංඛ්‍යාත්මක ව සමාන වීමට වූ අවශ්‍යතාව ය. ඉංගිරිසින් විසින් නිර්මණය කරනු ලැබූ මේ අවශ්‍යතාව ඔවුන් විසින් ම අවිශ්වාසයක් ගොඩනැගීම හා ඉන්පසු තමන්ට ලැබුණු වරප්‍රසාද රැකගැනීමට දෙමළ ප්‍රභූන් මෙහෙයවීම දක්වා වර්ධනය කරනු ලැබිණි. දෙමළ ප්‍රභූහු තමන්ට මධ්‍යයෙහි ඒ කරුණු ඉටුකරගැනීමට නොහැකි බව දැනගෙන වෙනම දෙමළ රාජ්‍යයක් බිහිකිරීමට කටයුතු කළහ. කොටි යනු දෙමළ ප්‍රභූන්ගේ මුණුබුරෝ හා දරුවෝ වෙති. අද ආනන්ද සංගරී මහතා කොටි ගැන කියන කරුණු පිළිබඳ ව අපේ විරෝධයක් නැතත් අප ඒ මහතාට මතක් කළයුතු වන්නේ කොටි බිහිකිරීමට කටයුතු කෙළේ ඒ මහතා ඇතුළු දෙමළ ප්‍රභූන් බව ය. ආන්ඩුව සර්වපාක්ෂික සම්මේලනය හා සර්ව පාක්ෂික නියෝජිත සම්මේලනය යොදාගත යුත්තේ කොටින්ට ඊනියා විසඳුම් ඉදිරිපත්කිරීමට නොව සම සභාපතිවරුන් හා කොටි පරාජයකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva